# නීතිපති දෙපාර්තමේන්තුව

## சட்டமா அதிபதி திணைக்களம்

# Attorney General's Department

## කාර්ය සාධන වාර්තාව - 2015

## Performance Report - 2015

## செயலாற்றுகை அறிக்கை - 2015

## දැක්ම

- ශ්‍රී ලංකාව වෙනුවෙන් සහ එහි ජීවත්වන සියලුම ජනතාව වෙනුවෙන් යුක්තිය හා සාධාරණත්වය ඉෂ්ඨ කිරීම සඳහා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය ලෙස කටයුතු කිරීම.

## අරමුණ

- ශ්‍රී ලංකා රජය සහ රජයේ ආයතන, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අවශ්‍ය සියලුම නෛතික සේවාවන් සහ නීති උපදෙස් නොපමාව සැපයීම සහ රජයේ පුළුල් අරමුණු ව්‍යාප්ත කිරීමේ ක්‍රියාවලියේ දී සුවිශේෂී මෙහෙවරක් ඉටු කිරීම.

## මෙහෙවර

- ශ්‍රී ලංකාවේ අපේක්ෂාවන් සපුරාලීම උදෙසා, ගෞරවනීයවත්, අභිමානවත් ලෙසත්, අවංක ලෙසත් කටයුතු කිරීම සහ අපගේ උපරිමයෙන් ශ්‍රී ලාංකික ජනතාවට සේවය කිරීම.

- සාමාජීය සහ ආර්ථික සෞභාග්‍යය, සම අවස්ථාවන් සහ මානව දයාව දිරිගැන්වීමේ ප්‍රයත්නයේ දී ශ්‍රී ලාංකිය ජනතාව උදෙසා සාධාරණත්වය, ආරක්ෂාව සහ ස්වාධීනත්වය තහවුරු කරනු වස්, අපක්ෂපාතීව සහ සාධාරණ ලෙස ශ්‍රී ලංකාවේ නීතීන් ක්‍රියාත්මක කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව ප්‍රයත්න දරනු ඇත.

# පටුන

<u>අන්තර්ගතය</u> <u>පිටු අංකය</u>


1. නීතිපති දෙපාර්තමේන්තුවේ පසුබිම — 1

2. නීතිපති දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය — 2

3. කාර්ය මණ්ඩල තොරතුරු — 3

4. නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය — 4

   i. අපරාධ නඩු අංශය
   ii. සිවිල් අංශය
   iii. රාජ්‍ය නීතිඥ අංශය
   iv. ශ්‍රේෂ්ඨාධිකරණ අංශය
   v. සංස්ථා අංශය
   vi. ළමා අපචාර නඩු ඒකකය
   vii. මහජන පැමිණිලි ඒකකය

   - නඩු අංශවල කාර්ය සාධනය සංක්ෂිප්තව — 12

   viii. ආයතන අංශය — 13-15
   ix. ගිණුම් අංශය — 16

   (i – ix) — 5-16

## නීතිපති දෙපාර්තමේන්තුව

## (තැ.පෙ. අංක 502, කොළඹ 12.)


### පසුබිම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් පෙනී සිටින ප්‍රධාන නීති නිලධාරියා නීතිපතිවරයා වන අතර දෙපාර්තමේන්තු ප්‍රධානියා හා ගණන් දීමේ නිලධාරියා වශයෙන් ගරු නීතිපතිතුමා කටයුතු කරයි. "ඒ" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වන නීතිපති දෙපාර්තමේන්තුව අධිකරණ අමාත්‍යාංශය භාරයේ පවතී.

නීතිපති දෙපාර්තමේන්තුව මධ්‍යම රජයට, පළාත් සභාවලට, රජයේ දෙපාර්තමේන්තුවලට, ව්‍යවස්ථාපිත මණ්ඩල හා අනිකුත් අර්ධ රාජ්‍ය ආයතනවලට නීතිමය සහාය ලබාදෙයි. එකී සහාය ලබාදීමේ දී දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීන් විසින් ප්‍රධාන වශයෙන් සිවිල්, අපරාධ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ වාණිජ යන කාරණා සම්බන්ධයෙන් රජයට සහ රජයට අයත් ආයතන වලට උපදෙස් දීමත්, දිවයිනේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අනිකුත් අධිකරණවල හා කම්කරු විනිශ්චය සභාවල පවරා ඇති නඩු වලදී රජය සහ රාජ්‍ය ආයතන නියෝජනය කිරීමත් සිදු කරනු ලැබේ.

සිවිල් අංශය, අපරාධ නඩු අංශය හා රාජ්‍ය නීතිඥ අංශය වශයෙන් ප්‍රධාන අංශ තුනක් මගින් දෙපාර්තමේන්තුවේ සිවිල් හා අපරාධ නඩුවලට අදාලව කටයුතු ඉටු කරනු ලබන අතර පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා ආයතන අංශය හා ගිණුම් අංශය ස්ථාපිත කර ඇත. මෙම අංශවලට අමතරව දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට සංස්ථා අංශය, හදිසි අවස්ථා නියෝග හා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පවරන නඩු සම්බන්ධව කටයුතු කරන ඊ්ආර් ඒකකය, ළමා අපචාර නඩු ඒකකය, ආගමන හා විගමන ඒකකය, මහජන පැමිණිලි ඒකකය, ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය යන ඒකක නීතිපති දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මකව පවතී.

## 2. නීතිපති දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



## 3. කාර්ය මණ්ඩල තොරතුරු ( 2015.12.31 දිනට)

| සේවක කාණ්ඩ මට්ටම් | තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | | | දැනට සිටින කාර්ය මණ්ඩලය | | |
|---|---|---|---|---|---|---|---|
| | | ස්ථිර | අනියම් | කොන්ත්‍රාත් | ස්ථිර | අනියම් | කොන්ත්‍රාත් |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | නීතිපති | 1 | _ | _ | 1 | _ | _ |
| | සොලිසිටර් ජනරාල් | 1 | _ | _ | 1 | _ | _ |
| | ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් | 2 | _ | _ | 2 | _ | _ |
| | අතිරේක සොලිසිටර් ජනරාල් | 9 | _ | _ | 9 | _ | _ |
| | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් | 9 | _ | _ | 9 | _ | _ |
| | නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් | 19 | _ | _ | 19 | _ | _ |
| | ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ | 56 | _ | _ | 35 | _ | _ |
| | රජයේ අධිනීතිඥ / තාවකාලික වැඩබලන රජයේ අධිනීතිඥ | 118 | _ | _ | 100 | _ | _ |
| | සහකාර රජයේ අධිනීතිඥ (පරිවාස) | _ | 130 | _ | _ | 0 | _ |
| | ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නීතිඥ | 1 | _ | _ | 1 | _ | _ |
| | රාජ්‍ය නීතිඥ | 2 | _ | _ | 2 | | _ |
| | ජ්‍යෙෂ්ඨ සහකාර රාජ්‍ය නීතිඥ | 6 | _ | _ | 6 | _ | _ |
| | සහකාර රාජ්‍ය නීතිඥ | 18 | _ | _ | 6 | _ | _ |
| | කණිෂ්ඨ සහකාර රාජ්‍ය නීතිඥ | 28 | _ | _ | 0 | _ | _ |
| | අධ්‍යක්ෂ (මුදල්) | 1 | _ | _ | 1 | _ | _ |
| තෘතීය මට්ටම | පරිපාලන නිලධාරී | 3 | _ | _ _ | 3 | _ | _ _ |
| | පුස්තකාලයාධිපති (අධි පන්තිය) | 1 | _ | _ | 1 | _ | _ |
| | භාෂා පරිවර්තක | 8 | _ | _ | 6 | _ | _ |
| ද්විතීය මට්ටම | සංඛ්‍යාලේඛන නිලධාරී | 1 | _ | _ | 0 | _ | _ |
| | අයවැය සහකාර | 1 | _ | _ | 1 | _ | _ |
| | පුස්තකාලයාධිපති | 4 | _ | _ | 1 | _ | _ |
| | රාජ්‍ය කළමනාකරණ සහකාර | 130 | _ | _ | 90 | _ | _ |
| | සම්බන්ධීකරණ ලේකම් | 1 | _ | _ | 1 | _ | _ |
| | පෞද්ගලික ලේකම් | 1 | _ | _ | 0 | _ | _ |
| | ලඝු ලේඛක | 28 | _ | _ | 0 | _ | _ |
| | දෙපාර්තමේන්තු ලිපිකරු | 27 | _ | _ | 27 | | _ |
| ප්‍රාථමික මට්ටම | රියදුරු | 87 | _ | _ | 81 | _ | _ |
| | කා.සේ.සේ. | 139 | _ | _ | 129 | _ | _ |
| | දෙපාර්තමේන්තු කා.සේ.සේ. | 22 | _ | _ | 22 | | _ |
| | මුරකරු | 7 | _ | _ | 0 | _ | _ |

## 4. නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය

නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය පහත පරිදි සංක්ෂිප්තව දැක්විය හැක.

- සිවිල්, අපරාධ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා, වාණිජ යන කාරණා, ජාත්‍යන්තර නීති කටයුතු සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමට අදාල කාරණා සම්බන්ධයෙන් රජයට සහ රජයට අයත් ආයතන වලට උපදෙස් දීම.

- දිවයිනේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අනිකුත් අධිකරණවල හා කම්කරු විනිශ්චය සභාවල පවරා ඇති නඩු වලදී රජය සහ රාජ්‍ය ආයතන නියෝජනය කිරීම.

- නව නීති සම්මත කිරීමේදී හා පවතින නීති සංශෝධනය කිරීමේදී අවශ්‍ය නෛතික උපදෙස් ලබාදීම.

ඉහත කාර්යයන් ඉටු කිරීමේ දී දෙපාර්තමේන්තුවේ පහත දක්වා ඇති අංශ නීති කාර්ය මණ්ඩලයට සහාය වෙයි.

- අපරාධ නඩු අංශය
- සිවිල් අංශය
- රාජ්‍ය නීතිඥ අංශය
- ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය
- සංස්ථා අංශය

තවද දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට විශේෂ වශයෙන් හඳුනාගත් වගකීම් පවරා ඇති විශේෂ ඒකක ද ක්‍රියාත්මක වේ.

එම ඒකක වන්නේ,

- මහජන පෙත්සම් ඒකකය (මහජන පෙත්සම් සම්බන්ධයෙන් කටයුතු කරන්නේ මෙම අංශයයි.)
- ළමා අපචාර නඩු ඒකකය (ළමුන් අපචාරවලට ලක් කිරීමට අදාල නඩු පිළිබඳ ක්‍රියා කිරීම පිණිස පිහිටුවා ඇත.)

නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉටුවිය යුතු ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සඳහා ඉහත කී අංශ සහ ඒකක කටයුතු කරනු ලබන අතර, නීතිපති දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු මෙහෙයවීම සඳහා ආයතන අංශය හා ගිණුම් අංශය ස්ථාපිත කර ඇත.

මෙම දෙපාර්තමේන්තුවේ එක් එක් අංශයේ කාර්යසාධනය පහත පරිදි සාරාංශ කර දැක්විය හැක.

## i. අපරාධ අංශය

මහේස්ත්‍රාත් අධිකරණ වලින් සෘජුවම හෝ පොලිස් දෙපාර්තමේන්තුවෙන්, උපදෙස් පතා අපරාධ නඩු විශාල සංඛ්‍යාවක් මෙම අංශයට ලැබෙන අතර, මහාධිකරණයේ හෝ මහේස්ත්‍රාත් අධිකරණයේ අපරාධ නීති කෘත්‍යයන් පැවරීම සිදු කරනු ලබයි.

එකී නඩු පිටපත් ලැබුණු පසු නීතිපති දෙපාර්තමේන්තුවේ ගොනුවක් විවෘත කරනු ලබන අතර, 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ ප්‍රතිපාදනයන්ට අනුව ඒ සඳහා කටයුතු කෙරෙනු ඇත.

මෙම ක්‍රියාවලියේදී සැකකරුවන්ට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීම හෝ සාක්ෂි ප්‍රමාණවත් නොවීම මත සැකකරුව නීති කෘත්‍යයෙන් නිදහස් කිරීම හෝ මහාධිකරණයට සෘජුවම අධිචෝදනා යැවීම සිදු කෙරේ. අපරාධ අංශයට අනුයුක්තව නිලධාරීන් 100 දෙනෙකු සිටින අතර, ශ්‍රී ලංකාවේ සෑම මහාධිකරණයටම අපරාධ අංශයේ එක් නිලධාරියෙකු අනුයුක්ත කොට ඇත.

**වරදේ ස්වභාවය අනුව වර්ග කරන ලද විෂයයන්**

CR 1 - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් විමර්ශනය කරනු ලබන නඩු

CR 2 - මැතිවරණ වලට අදාල වැරදි සහ කොළඹ වංචා විමර්ශන කාර්යාංශය මගින් විමර්ශනය කරනු ලබන නඩු

CR 3 - මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි

CR 4 - ණයපත් (ක්‍රෙඩිට් කාඩ්) වලට අදාල වැරදි

CR 5 - මූල්‍ය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් විමර්ශනය කරනු ලබන නඩු

OW - පීඩාකාරී ආයුධ පනත යටතේ වන වැරදි

EER/TR - හදිසි අවස්ථා රෙගුලාසි පනතේ යටතේ වන වැරදි

AG/T - පොලිස් භාරයේ සිටියදී සිදුවන වධහිංසා පැමිණිවීම්

I & E - ආගමන හා විගමන පනත යටතේ වන වැරදි

MTA - මාරක රිය අනතුරු වලට අදාල නඩු

**පළාත් පදනම මත වර්ගීකරණය කරන ලද විෂයයන්** - පැරණි වර්ගීකරණය (2010.12.31 දින දක්වා විවෘත කරන ලද ගොනු)

CM 1, CM 2, CM 3, CW 1, CW 2, CW3, CW 4, CB 1, CB 2, CS 1, CS 2, CN

මෙම දෙපාර්තමේන්තුවේ රාජකාරීන් සුමටව ඉටු කරනු ලැබීම සහ පළාත් මට්ටමින් ගොනු හඳුනා ගැනීම තහවුරු කරනු වස් 2011.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අපරාධ නඩු ගොනු වර්ගීකරණය කිරීමේ නව ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලද අතර, එය පහත දක්වා ඇත.

EP 1, EP 2, EP 3, EP 4, NP 1, NP 2, NP 3, NP 4, NCP 1, NCP 2, SP 1, SP 2, SP 3, SP 4, SP 5, CP 1, CP 2, CP 3, NWP 1, NWP 2, NWP 3, NWP 4, UP 1, UP 2, SGP 1, SGP 2, SGP 3, WP 1, WP 2, WP 3 , WP 4, WP 5, WP 6, MLA

**<u>අපරාධ අංශයේ කාර්ය සාධනය</u>**

ප්‍රගති වාර්තාව-අපරාධ අංශය (2015.01.01 සිට 2015.12.31 දක්වා)

| අනු අංකය | විෂයය | විවෘත කළ ලිපි ගොනු සංඛ්‍යාව | අධි චෝදනා යැවූ ගොනු සංඛ්‍යාව | උපදෙස් දුන් ගොනු සංඛ්‍යාව | නිදහස් කළ ගොනු සංඛ්‍යාව | වැඩ අවසන් කළ ගොනු සංඛ්‍යාව | ඉතිරි ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| 1 | **CR1** | 267 | 58 | 35 | 22 | 115 | 1467 |
| 2 | **CR2** | 95 | 9 | 15 | 0 | 24 | 504 |
| 3 | **CR3** | 1048 | 584 | 266 | 14 | 864 | 1372 |
| 4 | **CR4** | 14 | 8 | 0 | 0 | 8 | 85 |
| | **CR5** | 47 | 4 | 10 | 0 | 14 | 35 |
| 5 | **CM1** | 0 | 20 | 13 | 7 | 40 | 152 |
| 6 | **CM2** | 0 | 11 | 12 | 4 | 35 | 95 |
| 7 | **CM3** | 0 | 27 | 12 | 3 | 42 | 169 |
| 8 | **CW1** | 0 | 11 | 1 | 2 | 14 | 104 |
| 9 | **CW2** | 0 | 10 | 5 | 7 | 22 | 116 |
| 10 | **CW3** | 0 | 17 | 3 | 2 | 22 | 115 |
| 11 | **CW4** | 0 | 22 | 9 | 7 | 38 | 100 |
| 12 | **CB1** | 0 | 3 | 4 | 5 | 12 | 49 |
| 13 | **CB2** | 0 | 5 | 4 | 1 | 10 | 62 |
| 14 | **CS1** | 0 | 14 | 7 | 11 | 32 | 186 |
| 15 | **CS2** | 0 | 4 | 8 | 0 | 12 | 158 |
| 16 | **OW** | 165 | 94 | 3 | 11 | 108 | 291 |
| 17 | **AG/T** | 0 | 1 | 2 | 0 | 3 | 58 |
| 18 | **I & E** | 317 | 0 | 55 | 44 | 99 | 504 |
| 19 | **CN** | 0 | 2 | 7 | 2 | 11 | 38 |
| 20 | **EER** | 117 | 10 | 56 | 51 | 117 | 82 |
| 21 | **TR** | 7 | 0 | 2 | 2 | 4 | 20 |
| **මුළු එකතුව** | | **2077** | **914** | **529** | **195** | **1646** | **5762** |

ප්‍රගති වාර්තාව - අපරාධ අංශය -(2015.01.01 සිට 2015.12.31 දක්වා) නව වර්ගීකරණය යටතේ

| අනු අංකය | විෂයය | විවෘත කළ ලිපි ගොනු සංඛ්‍යාව | අධි චෝදනා යැවූ ගොනු සංඛ්‍යාව | උපදෙස් දුන් ගොනු සංඛ්‍යාව | නිදහස් කළ ගොනු සංඛ්‍යාව | වැඩ අවසන් කළ ගොනු සංඛ්‍යාව | ඉතිරි ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| 1 | **EP1** | 38 | 7 | 10 | 0 | 17 | 177 |
| 2 | **EP2** | 34 | 7 | 3 | 0 | 10 | 129 |
| 3 | **EP3** | 20 | 6 | 1 | 1 | 8 | 59 |
| 4 | **EP4** | 20 | 3 | 14 | 1 | 18 | 91 |
| 5 | **NP1** | 52 | 7 | 4 | 2 | 13 | 145 |
| 6 | **NP2** | 48 | 12 | 12 | 1 | 25 | 145 |
| 7 | **NP3** | 16 | 0 | 2 | 1 | 3 | 11 |
| 8 | **NP4** | 16 | 1 | 5 | 0 | 6 | 44 |
| 9 | **NCP1** | 151 | 23 | 6 | 5 | 34 | 330 |
| 10 | **NCP2** | 80 | 43 | 9 | 5 | 57 | 145 |
| 11 | **SP1** | 48 | 53 | 5 | 12 | 70 | 290 |
| 12 | **SP2** | 94 | 32 | 11 | 8 | 51 | 292 |
| 13 | **SP3** | 96 | 71 | 12 | 15 | 98 | 294 |
| 14 | **SP4** | 48 | 34 | 17 | 5 | 56 | 151 |
| 15 | **SP5** | 38 | 34 | 0 | 6 | 40 | 132 |
| 16 | **CP1** | 168 | 60 | 42 | 27 | 129 | 272 |
| 17 | **CP2** | 48 | 19 | 11 | 1 | 31 | 61 |
| 18 | **CP3** | 92 | 20 | 24 | 4 | 48 | 132 |
| 19 | **NWP1** | 140 | 82 | 18 | 16 | 116 | 455 |
| 20 | **NWP2** | 95 | 32 | 5 | 7 | 44 | 191 |
| 21 | **NWP3** | 32 | 14 | 4 | 5 | 23 | 68 |
| 22 | **NWP4** | 53 | 21 | 12 | 5 | 38 | 131 |
| 23 | **UP1** | 74 | 38 | 10 | 7 | 55 | 287 |
| 24 | **UP2** | 36 | 28 | 16 | 8 | 52 | 195 |
| 25 | **SGP1** | 89 | 59 | 23 | 17 | 99 | 251 |
| 26 | **SGP2** | 71 | 42 | 14 | 10 | 66 | 134 |
| 27 | **SGP3** | 107 | 82 | 20 | 15 | 117 | 183 |
| 28 | **WP1** | 264 | 52 | 36 | 18 | 106 | 931 |
| 29 | **WP2** | 152 | 45 | 12 | 8 | 65 | 286 |
| 30 | **WP3** | 113 | 43 | 21 | 10 | 74 | 304 |
| 31 | **WP4** | 128 | 38 | 11 | 14 | 63 | 280 |
| 32 | **WP5** | 75 | 26 | 23 | 16 | 65 | 206 |
| 33 | **WP6** | 178 | 71 | 33 | 26 | 130 | 419 |
| එකතුව | | **2714** | **1105** | **446** | **276** | **1827** | **7221** |

## ii. සිවිල් අංශය

ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය හා සිවිල් අභියාචනා මහාධිකරණවල ගොනු කර ඇති අභියාචනා, රිට් ආඥා සහ ප්‍රතිශෝධන නඩු හා දිවයිනේ විවිධ දිසා අධිකරණ වල ගොනු කරනු ලබන සිවිල් නඩු ඇතුළුව සියලුම සිවිල් හා වාණිජ නඩු කටයුතු සඳහා සිවිල් අංශය සහභාගි වෙයි. නීති සංශෝධනය කිරීම සහ නව නීති සම්මත කිරීම වැනි කාර්යයන් වලදී උපදෙස් ලබාදීමත්, පාර්ලිමේන්තුවේ ඒ ඒ කටයුතු සඳහා සහභාගීවීමත් උපදෙස් ලබාදීමත් සිදු කරනු ලැබේ. රජයේ දෙපාර්තමේන්තු වෙත නීති උපදෙස් ලබා දීම, විදේශ ණය ලබා ගැනීම සඳහා උපදෙස් දීම, මානව හිමිකම් කොමිසම විසින් යොමු කරනු ලබන කරුණු, නඩු පැවරීමේ දැන්වීම් පිළිබඳ නඩු, බේරුම්කරණ නඩු, ඉඩම් අත්පත් කර ගැනීමේ නඩු සහ රජයේ ඉඩම් වල අයිතිය නැවත ලබා ගැනීම සම්බන්ධ නඩු ආදිය සිවිල් අංශයේ නිලධාරීන් විසින් මෙහෙයවනු ලබන නඩු කටයුතු වලින් සමහරක් වේ.

අභියාචනාධිකරණය, දිසා අධිකරණය, පළාත්බද සිවිල් අභියාචනා මහාධිකරණ සහ කම්කරු විනිශ්චය සභා ආදීන් හී සිවිල් නඩු මෙහෙයවීම සඳහා සිවිල් අංශයට අනුයුක්තව නිලධාරීහු **93** දෙනෙක් සිටිති. ඔවුන්ගේ රාජකාරීන්ට අමතරව නෛතික ගැටලු පිළිබඳව රජයේ දෙපාර්තමේන්තු වෙත උපදෙස් ලබා දීම, විවිධ තාක්ෂණ කමිටු වලට සහභාගිවීම, දේශීය හා ජාත්‍යන්තර බේරුම්කරණයන් සඳහා පෙනී සිටීම සහ නෛතික වෘත්තිකයන්ගේ අනිසි හැසිරීම් වලට එරෙහිව ගොනු කරන ලද රීතිමය කරුණු සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙනී සිටීම ආදිය සඳහා ද මෙම නිලධාරීහු සහභාගි වෙති.

**සිවිල් අංශයේ වර්ගීකරණය කර ඇති විෂයයන්**

| | | |
|---|---|---|
| E | - | නීති උපදෙස් |
| FC | – | විදේශ ණය ලබා ගැනීම සඳහා උපදෙස් ලබා දීම. |
| CA/CA | – | අභියාචනාධිකරණ නඩු |
| CA/HC | – | මහාධිකරණ නඩු |
| HRC | – | මානව හිමිකම් කොමිසමට අදාල කරුණු |
| B | – | පනත් කෙටුම්පත් |
| CA/NA | – | නඩු පැවරීමේ දැන්වීම් |
| CA/DC | – | දිසා අධිකරණ නඩු |
| ARB | – | බේරුම්කරණ නඩු |
| C | – | රජයට එරෙහිව ගොනු කරන නඩු (රජයට ප්‍රතිපූර්ණ කිරීම) |
| L | – | ඉඩම් අත්පත් කර ගැනීමේ නඩු |

CE – රජයේ ඉඩම් වල අයිතිය නැවත ලබා ගැනීම

AA – රීතිමය කරුණු

AV - ගුවන් සේවා පිළිබඳ නඩු

CA/LT – කම්කරු විනිශ්චය සභා නඩු

CA/MC- මහේස්ත්‍රාත් අධිකරණ නඩු

<u>**සිවිල් අංශයේ කාර්ය සාධනය**</u>

| විෂයය | විවෘත කල ගොනු සංඛ්‍යාව | වැඩ අවසන් කල ගොනු සංඛ්‍යාව | ඉතිරි ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|
| E | 431 | 152 | 279 |
| FC | 25 | 01 | 24 |
| CA/CA | 579 | - | - |
| CA/HC | 312 | - | - |
| HRC | 07 | 03 | 04 |
| B | 54 | 13 | 41 |
| CA/NA | 292 | - | - |
| CA/DC | 409 | - | - |
| ARB | 02 | - | - |
| C | 331 | - | - |
| L | 174 | - | - |
| CE | 62 | - | - |
| AA | 10 | 02 | 08 |
| CA/LT | 09 | - | - |
| CA/MC | 22 | - | - |
| **Total** | **2719** | **171** | **356** |

සිවිල් අංශයෙන් විවෘත කරනු ලබන ගොනු වලින් බහුතර සංඛ්‍යාවක් රාජ්‍ය නීතිඥ අංශය හරහා කටයුතු කරනු ලබන බව සළකන්න.

## iii. රාජ්‍ය නීතිඥ අංශය

සිවිල් අංශය මගින් විවෘත කරනු ලබන ගොනු රාජ්‍ය නීතිඥ අංශයට ලැබෙන අතර, ඉන්පසුව දිවයින පුරා පිහිටි සිවිල් අධිකරණ වලදී එම නඩු සඳහා පෙනී සිටීම සිදු වේ.

ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නීතිඥවරයෙකු, රාජ්‍ය නීතිඥවරුන් දෙදෙනෙකු ද ඇතුලුව නිලධාරීන් 15 දෙනෙකු රාජ්‍ය නීතිඥ අංශයේ සේවය කරනු ලබන අතර, ඔවුනට අමතරව සිවිල් නඩු සඳහා උපදෙස් ලබා දීමේ කාර්යයට සහභාගී වන රජයේ නීතිඥවරුන්ගෙන් සමන්විත ජාලයක් ද ඔවුන් සතු වෙයි. (කලින් රජයේ පෙරකදෝරු ලෙස හැඳින්වූ)

මෙම ශාඛාව වාර්ෂිකව අති විශාල සිවිල් නඩු සංඛ්‍යාවක් මෙහෙයවනු ලබන අතර, මෙම වසර තුළදී සිවිල් නඩු **3315** ක් අවසන් කර ඇත.

## iv. ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය

මෙය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරනු ලබන නඩු පමණක් මෙහෙයවනු ලබන විශේෂ ඒකකයකි.

අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් නිලධාරිහු 11 දෙනෙකු සහ අනෙකුත් ශ්‍රේණි වල නිලධාරිහු මෙම ඒකකයේ සේවය කරති.

2015 වර්ෂය තුළදී මූලික අයිතිවාසිකම් නඩු ද ඇතුලුව නඩු විශාල සංඛ්‍යාවක් මෙම ඒකකය මගින් මෙහෙයවනු ලැබිණි.

2015 වර්ෂය තුළදී ගොනු 508 ක් විවෘත කරන ලද අතර, එම ගොනු වලින් 82 ක්ද ඊට පෙරාතුව විවෘත කරන ලද ගොනු 450ක්ද ඇතුළු ගොනු 532 ක වැඩ මෙම වර්ෂය තුළදී අවසන් කර ඇත.

## v. සංස්ථා අංශය

රජයේ සංස්ථා වලට, ව්‍යවස්ථාපිත ආයතන වලට සහ විවිධ අර්ධ රාජ්‍ය සංවිධාන වලට ඔවුන්ගේ නෛතික ගැටලු සඳහා සහනදායි මුදලකට සහාය වීම අරමුණු කොටගෙන 1990 වර්ෂයේදී මෙම ඒකකය පිහිටුවන ලදී.

2015 වර්ෂයේදී එහි ගොනු 1681 ක් විවෘත වූ අතර, ගොනු 1871 ක් අවසන් කරන ලදී.

**සංස්ථා අංශයේ විෂයයන් වර්ගීකරණය කිරීම.**

CA – රජයේ ආයතනය විත්තිකරු හෝ වග උත්තරකරු වන නඩු

C – රජයේ ආයතනය පැමිණිලිකරු හෝ අභියාචක වන නඩු

E – උපදෙස් ගොනු

BCL - ගිවිසුම්

ARB - බේරුම්කරණ

SPC – පළාත් සභා ව්‍යවස්ථාවන්

L – ඉඩම් අත්පත් කර ගැනීමේ නඩු

WB - හිඟ ජලබිල් පත් අයකර ගැනීමේ නඩු

**<u>සංස්ථා අංශයේ කාර්ය සාධනය</u>**

| විෂයය | විවෘත කළ ගොනු සංඛ්‍යාව | වැඩ අවසන් කළ ගොනු සංඛ්‍යාව | ඉතිරි ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|
| **CA** | 1081 | 854 | 1950 |
| **C** | 251 | 724 | 2462 |
| **E** | 216 | 149 | 510 |
| **BCL** | 36 | 45 | 08 |
| **ARB** | 12 | 08 | 14 |
| **FC** | 01 | 01 | 02 |
| **SPC** | 01 | - | 05 |
| **L** | 03 | - | 05 |
| **WB** | 80 | 90 | 409 |
| **Total** | **1681** | **1871** | **5365** |

## vi. ළමා අපචාර නඩු ඒකකය

නීතිපතිතුමාගේ උපදෙස් ලබා ගැනීම සඳහා යොමු කරනු ලබන ළමා අපචාර සහ කාන්තාවන්ට එරෙහි ලිංගික වැරදි වලට අදාල නඩු ඉක්මණින් අවසන් කිරීමේ අරමුණින් මෙම ඒකකය 2004 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී.

අතිරේක කාර්ය මණ්ඩලයක් ද සමග තරුණ නීතිඥවරුන් 14 දෙනෙකු මෙම ඒකකයේ රාජකාරි ඉටු කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් බඳවා ගෙන ඇත.

2015 වර්ෂය තුළදී මෙම ඒකකය විසින් එවැනි නඩු විශාල සංඛ්‍යාවක් මෙහෙයවන ලදී. මෙම වර්ෂයේදී ගොනු **3338** ක් විවෘත වූ අතර, ගොනු 1801 ක වැඩ අවසන් කරන ලදී.

## vii. මහජන පැමිණිලි ඒකකය

සාමාන්‍ය මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි වලට යම් සහනයක් සැලසීමේ අරමුණින් එම පැමිණිලි මෙම ඒකකයට යොමු කරනු ලැබේ. වර්තමානයේදී මෙම පෙත්සම් පිළිබඳව කටයුතු කිරීම නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් වරයෙකු යටතේ සිදුවේ.

ඉහත එක් එක් අංශයන්හි 2015 වර්ෂයේ කාර්ය සාධනය පහත පරිදි සංක්ෂිප්ත කොට දැක්විය හැකිය.

| ශාඛාව | විවෘත කල ලිපිගොනු සංඛ්‍යාව | අධිචෝදනා යැවූ ගොනු සංඛ්‍යාව | උපදෙස් දුන් ගොනු සංඛ්‍යාව | නිදහස් කල ගොනු සංඛ්‍යාව | වැඩ අවසන් කල ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| * සිවිල් අංශය | 2719 | - | 158 | - | 171 |
| අපරාධ නඩු අංශය | 4791 | 2019 | 975 | 471 | 3473 |
| * රාජ්‍ය නීතිඥ අංශය | 165 | - | - | - | 3315 |
| ශ්‍රේෂ්ඨාධිකරණ ඒකකය | 508 | - | - | - | 532 |
| සංස්ථා අංශය | 1681 | - | - | - | 1871 |
| කාන්තා හා ළමා අපචාර නඩු ඒකකය | 3338 | 577 | 370 | 854 | 1801 |
| මහජන පෙත්සම් අංශය | 591 | - | 35 | - | 217 |

* සිවිල් අංශය මඟින් විවෘත කරනු ලබන ගොනු වලින් බහුතර සංඛ්‍යාවක් රාජ්‍ය නීතිඥ අංශය හරහා කටයුතු කරනු ලබන බව සලකන්න.

## viii. ආයතන අංශය

ආයතන අංශය දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යයන් සුමටව ඉටුකර ගැනීමට ආයතනික වශයෙන් සහාය වෙමින් නිහඬ මෙහෙවරක් ඉටුකරනු ලබයි. මෙම දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශයන්ට සාපේක්ෂව බොහෝ දුරට ප්‍රමාණාත්මක දත්ත මගින් කාර්ය සාධනය ඉදිරිපත් කළ නොහැකි බැවින්, ආයතන අංශයේ 2015.01.01 සිට 2015.12.31 දක්වා වූ කාලච්ඡේදයට අදාල කාර්ය සාධනය පහත පරිදි දක්වා ඇත.

- **බඳවා ගැනීම්, පුරප්පාඩු පිරවීම් හා තනතුරු ඇති කිරීම්**

**නීති නිලධාරීන් :-**

- ○ රජයේ අධිනීතිඥ තනතුරෙහි පුරප්පාඩු 30ක් සම්පූර්ණ කිරීම සඳහා බඳවා ගැනීම් සිදුකර ඇත.

**දෙපාර්තමේන්තුගත තනතුරු :-**

- ○ 2015 අයවැය යෝජනා අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 යටතේ දින 180 ක අඛණ්ඩ හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන් 49 දෙනෙකුට දෙපාර්තමේන්තුගත ලිපිකරු තනතුරු 27 ක් හා දෙපාර්තමේන්තුගත කාර්යාල සේවක සේවයේ තනතුරු 22 ක් සඳහා ස්ථිර පත්වීම් ප්‍රදානය කරන ලදි.

**රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය :-**

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ, පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරන ලෙස ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඉල්ලීම් කර ඇත.

**කනිෂ්ඨ සේවක :-**

- ○ කාර්යාල සේවක සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමු කර ඇත.

- ○ රියදුරු සේවයේ ඇති පුරප්පාඩු 03 ක් සම්පූර්ණ කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී ඇති අතර ඉතිරි පුරප්පාඩු04 ක් සඳහා බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමු කර ඇත.

- ○ මුරකරු තනතුරු 07 ක් සඳහා බඳවා ගැනිමට සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරමින් පවතී.

- **නිවාඩු පරිගණකගත කිරීම**

දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ගේ හා සේවකයින්ගේ නිවාඩු, අදාල ලේඛණ වල ඇතුලත් කිරීමට අමතරව, ඒ සඳහා විශේෂයෙන්ම සකස් කල පරිගණක වැඩසටහනක් යටතේ නිවාඩු පරිගණකගත කිරීමට කටයුතු කර ඇත. මෙහිදී මාණ්ඩලික නිලධාරීන් විසින් නිවාඩු ලබා ගැනීමේදී (විදේශ නිවාඩු හා විශේෂයෙන් ලිඛිතව අනුමැතිය ගත යුතු නිවාඩු හැර) නිලධාරියා විසින්ම පරිගණකය හරහා එවලේම (Online) සිය අධීක්ෂණ නිලධාරියාට අනුමැතිය සඳහා ලැබෙන සේ නිවාඩු අයදුම් කල හැක.

- **ආපදා ණය ලබා දීම**

ආපදා ණය ගෙවීමේදී ඉල්ලුම්කරුවන් පොරොත්තු ලේඛණයේ දීර්ඝ කාලයක් රඳවා ගැනීමකින් තොරව ඉතා කඩිනමින් ආපදා ණය ගෙවීමට කටයුතු කර ඇත.

2015.01.01 සිට 2015.12.31 දක්වා ආපදා ණය ඉල්ලුම් කිරීම හා ගෙවීම පිළිබඳ දත්ත පහත පරිදි වේ.

| තනතුර | ඉල්ලුම්කරුවන් සංඛ්‍යාව | ණය මුදල් ලැබූ සංඛ්‍යාව |
|---|---|---|
| මාණ්ඩලික | 30 | 30 |
| රාජ්‍ය කලමනාකරණ සහකාර සේවය හා අනෙකුත් සේවා | 43 | 43 |
| කාර්යාල සේවක සේවය | 45 | 45 |
| රියදුරු | 21 | 21 |

ඒ අනුව 2015.01.01 සිට 2015.12.31 දක්වා වූ කාලය ඇතුළත රුපියල් **12,109,394.00** ක මුදලක් ආපදා ණය ගෙවීම සඳහා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමෙන් වැය කර ඇත.

- **විශ්‍රාම වැටුප් ගෙවීම**

නිලධාරියෙකු හෝ සේවක මහත්මයෙකු විශ්‍රාම යාමේදී විශ්‍රාම වැටුප් ගෙවීමට අවශ්‍ය සියලුම ලියකියවිල සකස් කර අප්‍රමාදව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සලස්වන අතර, ඒ අනුව අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව විශ්‍රාම වැටුප සහ/හෝ පාරිතෝෂිකය ලබා ගැනීමට මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට/සේවකයින්ට හැකියාව ලැබී ඇත.

ඒ අනුව 2015 වර්ෂයේ විශ්‍රාම යන ලද 10 දෙනෙකුගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂික ප්‍රමාදයකින් තොරව ගෙවීමට කටයුතු කර ඇත.

- **පුහුණුව හා භෞතික සම්පත් ලබාදීම තුලින් මානව සම්පත් සංවර්ධනය**

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් **67** දෙනෙකු, කාර්යාල සේවක සේවයේ **02** දෙනෙකු හා රියදුරු සේවයේ **19** දෙනෙකු මෙම වර්ෂය තුළදී ශ්‍රී ලංකා පරිපාලන ආයතනයේ පුහුණු පාඨමාලාවලට සහභාගී කරවා ඇත. මීට අමතරව දෙමළ භාෂා පුහුණු පාඨමාලාවලට ද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් **05** දෙනෙකු හා කාර්යාල සේවක සේවයේ එක් නිලධාරියෙකු සහභාගී කරවීමට කටයුතු යොදා ඇත.

තවද විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත විදේශීය විශ්ව විද්‍යාල හා නොයෙකුත් ආයතන මගින් පිරිනමනු ලබන නීති ක්ෂේත්‍රයට අදාල ශිෂ්‍යත්ව තුලින් නීති නිලධාරීන්ට විදේශගත වී පුහුණුවීම සඳහා අවස්ථාව ලබා දී ඇත.

- **යටිතල පහසුකම් සංවර්ධනය**

  - දෙපාර්තමේන්තුව සඳහා ඉදිකරන නව ගොඩනැගිල්ලේ පාදමේ කොන්ක්‍රිට් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු වන සියෙරා ආයතනයට වැඩබිම භාර දී ඇත.
  - මන්නාරම හා වව්නියාව රජයේ අධිනීතිඥ නිලනිවාස ඉදි කිරීම සඳහා මුල්ගල් තැබීම සිදුකර වැඩ ආරම්භ කර ඇත.
  - කුරුණෑගල රජයේ අධිනීතිඥ නිලනිවාසය ඉදි කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් වෙන්කර දී තිබූ බිම් කොටස දෙපාර්මේන්තුවට පවරා ගැනීම සිදු කරන ලදී.
  - මහනුවර රජයේ අධිනීතිඥ නිලනිවාසය ඉදිකිරීම සඳහා බහිරවකන්ද ප්‍රදේශයෙන් බිම් කොටසක් කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් විසින් වෙන්කරදී ඇත.

## <u>2015.01.01 සිට 2015.12.31 දක්වා වැය විස්තරය</u>

ශීර්ෂය 229
වැඩසටහන 01
ව්‍යාපෘතිය 01

**2015.01.01 සිට 2015.12.31 දක්වා පුනරාවර්තන වියදම්**

| වැය විෂය විස්තරය | අයවැය ප්‍රතිපාදන | ශුද්ධ ප්‍රතිපාදන | මුළු වියදම |
|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 272,500,000 | 383,646,000 | 382,981,768 |
| අනෙකුත් පුනරාවර්තන | 235,000,000 | 273,970,000 | 272,084,987 |

**2015.01.01 සිට 2015.12.31 දක්වා ප්‍රාග්ධන වියදම්**

| විෂය සහ විෂය අංකය | අයවැය ප්‍රතිපාදන | ශුද්ධ ප්‍රතිපාදන | ශුද්ධ වියදම |
|---|---|---|---|
| 2001 - ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 8,000,000 | 8,000,000 | 7,633,422 |
| 2002 - යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 2,000,000 | 2,000,000 | 1,172,258 |
| 2003 - වාහන අළුත්වැඩියා කිරීම් | 4,500,000 | 4,500,000 | 4,428,883 |
| 2101 - වාහන මිලදී ගැනීම් | - | 660,000 | 651,400 |
| 2102 - ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 7,500,000 | 7,500,000 | 7,491,985 |
| 2103 - යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම් | 8,000,000 | 7,340,000 | 7,339,640 |
| 2401 - කාර්යමණ්ඩල පුහුණු කිරීම් | 19,000,000 | 34,500,000 | 19,219,999 |
| 2502 - ආයෝජන | 556,000,000 | 546,000,000 | 43,254,483 |

**2015.01.01 සිට 2015.12.31 දක්වා අත්තිකාරම් ගිණුම**

| වියදමෙහි උපරිම සීමාව | ලැබීම්වල අවම සීමාව | හර ශේෂයන්ගේ උපරිම සීමාව |
|---|---|---|
| 18,638,232 | 18,787,284 | 41,999,877 |